# ප්‍රසිද්ධ දැන්වීම

## අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය

## රාජ්‍ය භාෂා කොමිෂන් සභාව

### රියදුරු (III ශ්‍රේණිය) පුරප්පාඩු සඳහා බඳවාගැනීම.

රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ රියදුරු III ශ්‍රේණියේ තනතුරුවල පවතින පුරප්පාඩු 02 ක සඳහා බඳවාගැනීමට අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්කරුවන් පහත සඳහන් සුදුසුකම් සපුරාලිය යුතු ය.

1. රියදුරු - III ශ්‍රේණිය

බඳවා ගැනීමේ සුදුසුකම්

බාහිර අයදුම්කරුවන් :

(I) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකින් යටත් පිරිසෙයින් සම්මාන දෙක (02)ක් සහිතව විෂයයන් හය (06) කින් සමත්වීම.

(II) මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ බර වාහන පැදවීම සඳහා වූ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම සහ රියදුරු බලපත්‍රය ලැබීමෙන් පසු රිය පැදවීම සම්බන්ධයෙන් අවම වශයෙන් වසර තුන (03) ක පළපුරුද්දක් ලබා තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන් :

(I) මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ බර වාහන පැදවීම සඳහා වූ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම සහ රියදුරු බලපත්‍රය ලබාගැනීමෙන් පසු රිය පැදවීම සම්බන්ධයෙන් අවම වශයෙන් වසර තුන (03) ක පළපුරුද්ද ලබා තිබීම.

සහ

(II) ප්‍රාථමික අර්ධ ශිල්පීය (PL 2) හෝ ප්‍රාථමික ශිල්පීය නොවන (PL 1) සේවා ගණයක වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණකර තිබීම.

වැටුප් පරිමාණය :

PL 3 – 2025 - රු. (43,280-10x490-10x540-10x590-12x630- 67,040)

(2025.03.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව වැටුප් ගෙවීම් සිදු කරනු ලැබේ.)

සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :

(I) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.

(II) තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

(III) විශිෂ්ට චරිතයක් විය යුතු ය.

(IV) තනතුර සඳහා ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතු අතර අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

(V) මෙම තනතුර ස්ථිර, විශ්‍රාම වැටුප් රහිත තනතුරක් වේ. පත්වීම්ලාභීන් සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතු ය. සේවා යෝජකයාගෙන් 12% කි. සේවකයාගෙන් 8% කි. කොමිෂන් සභාව විසින් පත්වීම්ලාභියාගේ වැටුපෙන් 3% ට සමාන මුදලක් සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට ගෙවනු ඇත.

(VI) තනතුරකට පත්වීමක් ලබන්නෙකු වසර 03 ක පරිවාස කාලයකට යටත් වේ.ඔහුගේ/ ඇයගේ සේවය වැඩ හා හැසිරීම සතුටුදායක නම් සහ පළමුවැනි කාර්යක්ෂමතා කඩයිම් විභාගය සමත්වී ඇත්නම් පරිවාස කාලය අවසානයේ ඔහු/ඇය සේවයේ ස්ථිර කරනු ඇත.

අයදුම්පත් එවිය යුතු පිළිවෙළ :

ඇමුණුම 01 හි දක්වා ඇති ආකෘතියට අනුව සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය 2025/12/05 දින හෝ එදිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. 2025/12/05 දිනෙන් පසුව කොමිෂන් සභාව වෙත ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. (අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ තනතුරු නාමය සඳහන් කර එවිය යුතු ය.)

මෙම නියමයන්ට අනුකූල නොවන ඉල්ලුම් පත්‍ර හා නියමිත දිනට පසුව ලැබෙන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් එවිය යුතු ලිපිනය: සභාපති,රාජ්‍ය භාෂා කොමිෂන් සභාව," ජනජයසිටි" ගොඩනැගිල්ල, 09 වන මහල, නාවල පාර,රාජගිරිය.

සභාපති,
රාජ්‍ය භාෂා කොමිෂන් සභාව,
2025.11.21